

# ‘තුවරලා - කවි රස වින්දන’

"අදර දිය පොද      වැටුණා
දිවිය අරුතකි      සිතුණා
සසර බැඳි පෙම      දැනුණා
තුවරලා මල      පිපුණා"

මෙම කෙටි පැදිය, ‘තුවරලා’ නමින් පසුගිය දිනක එළිදැක්වුණ කෙටි කාව්‍ය කෘතියක ‘පිදුම’ ලෙස සටහන් වූ රසවත් නිර්මාණයකි. ‘තුවරලා’ යන යෙදුම ශ්‍රවණය වූ සැණින් එහි අරුත පිළිබඳව පාඨක සිත් තුළ කුතුහලයක් මතු වනු නො- අනුමානය. එම කුතුහලය යම් තරමකට හෝ සන්සිඳුවන්නට උපකාරී වන අර්ථවත් හැඳින්වීමක්




මෙම කාව්‍ය කෘතියෙහි ආරම්භයට යොදා ඇත්තේ, මහාචාර්ය සමන් චන්ද්‍ර රණසිංහ මහතාය. සිය පැහැදිලි කිරීම මෙසේ අරඹන මහාචාර්ය රණසිංහ ‘තුවරලා’ යන අප්‍රකට වදන ගැන තම මතය පළ කරයි. "තෝර ගසට තුවර යැයි කියති. තුවරලා යනු සුවඳ පැළෑටියකි. ශාන්ති කර්මවලදී භාවිතයට ගන්නා කට්ටකුමන්ජල්වලට ද තුවරලා යැයි කියති. තුවරලාවල රැඳී ඇත්තේ දොස් නිවන ගුණයකැයි ද පවසති."

මේ අයුරින් දේශීය වෛද්‍ය ක්‍රමයට සම්බන්ධව, ඖෂධීය ගුණයකින් යුක්ත පැළෑටියක නමකින් සිය ප්‍රථම කාව්‍ය කෘතිය හඳුන්වන්නට එහි කතුවර, වෛද්‍ය සමාධි විශ්වනාත් රාජපක්ෂ යොමු වී තිබීම විශේෂත්වයකි. ‘තුවරලා’ කාව්‍ය සංග්‍රහයට පෙරවදනක්, ලෙස තම අදහස් පළ කරන, මහාචාර්ය සමන් චන්ද්‍ර රණසිංහ, ‘තුවරලා’ නිර්මාපකයා පිළිබඳව ද කෙටියෙන් යමක් පවසන්නේ මෙලෙසිනි. "ගිලන් ගත සිත රැඳි දොස් නිවන ජීවක සහෘදයෙක් ‘තුවරලා’ කවි කුසුම රැගෙන කවි ලොවට පැමිණ සිටියි. හේ, වෛද්‍ය සමාධි විශ්වනාත් රාජපක්ෂය."

කතුවරයා තම ‘කවි කුසුම’ සරසා ඇත්තේ කෙටි හා දිග කවි පන්ති විස්සකිනි. විවිධ මාතෘකා අළලා ලියවුණ මෙම කාව්‍ය රචනා සැබවින්ම දේශීය




පරිසරය, දේශීය සංස්කෘතිය මතු කෙරෙන සේ රසවත් පදවැල් එක් කොට නිර්මාණය වී ඇත. මිනිස් ජීවිතය හා සම්බන්ධ වන, එදිනෙදා දිවියට වැදගත් වන මෙන්ම දේශාභිමානය ද ඔපවත් කර දක්වන අන්දමේ කාව්‍ය නිර්මාණ මගින් කතුවරයා මෙම කෘතියට පාඨක රුචිය ඇදබැඳගැනීමට සමත් වී ඇත. මෙහි අන්තර්ගත ප්‍රථම කවි පෙළින්ම ඔහු,

**<u>බොහෝ නිර්මාණ කරුවන් සිය නිර්මාණ සඳහා උපයෝගී කරගන්නා තේමාවන් අතර ‘අම්මා’ ප්‍රධානත්වය දරන බවට සිංහල කවිය හා ගීතය පෝෂණය කළ ශ්‍රේෂ්ඨ නිර්මාණ කරුවන්ගේ කෘති සාක්ෂි දරයි.</u>**

රසික හදවත් තුළ දේශාභිමානය මතු කර ලන්නට දරන උත්සාහය පැහැදිලිය.

තරමක් දීර්ඝ පද පෙළක් සකසමින් සිවුපද ලෙස නිර්මාණය කොට ඇති මෙම රචනාව තුළ කියවන්නාට තම රටෙහි ජාතික සම්පත් පිළිබඳව මෙන්ම එහි ස්වභාව සෞන්දර්යය පිළිබඳව ද අගනා සිතුවිලි පහළ කරගන්නට හැකි වන අයුරින් ලියවී ඇති බව පැහැදිලිය. බෙහෙවින් සරල පද මාලාව හේතු කොට ගෙන රසිකයාට එහි අරුත් පිළිබඳ දුරවබෝධයකින් තොරව රස විඳගැනීමට සමාධි රාජපක්ෂ ඉඩ හසර සලසා ඇත.

"ඈත පෙරදිග ඉන්දු සයුරේ බැබළුණා වූ
මගේ      ලංකා
සාර කෙත්වතු සීත ගඟුලැලි පේවි පේවී
අසිරි      ලද්දා
ලෙළෙන බඳ ඇති අඟන මහවැලි කොමළ සිනහා
මුකුළු කැන්දා
තුමුල සමනල කඳු නමුණුකුළ දෙපස පවනින්
පහස      වින්දා"

කවියක තිබිය යුතු උපමා - උපමේය සම්බන්ධතාව ගැන ද අවධානයෙන් යුතුව පද පෙළගැස්වීමට කතුවරයා තුළ ඇති ශක්‍යතාව මෙම කවියෙන්ම ස්ඵුට වෙයි. අර්ථ රසය සමග මතු වන ශබ්ද රසය ද සමගින් මෙම කවි පෙළෙහි අගය තවත් වැඩි වී ඇත. සමාධි රාජපක්ෂ තම කෘතියට ඇතුළත් කර ඇති මෙම කවි පෙළ මෙන්ම වෙනත් නිර්මාණ බොහොමයක්ම හුදෙක් කවි ලෙස කියවා රස විඳගැනීමෙන් ඔබ්බට යමින්, මනහර තනු යොදා ගීත ලෙස ගායනා කිරීමේ හැකියාව ද ඇත.

කතුවරයා සිය කාව්‍ය නිර්මාණ සඳහා ස්වාභාවික ලෝකය හා බැඳුණු වස්තු මෙන්ම කාව්‍යමය යෙදුම් හා මනඃකල්පිත වර්ණනාත්මක යෙදුම් ද ඇතුළත් කර ඇති බවට සාක්ෂි මෙම කවි පෙළෙන්ම සොයාගත හැකිය.

"සයුරු පරයන මහා වැව් රජ
රටේ ගොවි හද ගිනි      නිවන්නේ
රුවන් පුර මිණි කිරණ වැද වැද
අලංකාරව      දිදුලමින්නේ
අහස් කුස තුළ දේව ජනයා
දිවා රෑ රැකවල්      යොදන්නේ
නමෝ මාගේ ලංකා මාතා
මතු දිනක ලෝ      බබුළුවන්නේ"

කවියාගේ පැතුම සැබවින්ම පාඨකයා තුළ ද ජාතිකාභිමානය මෙන්ම ජාත්‍යාලය ද තව තවත් තීව්‍ර කරවයි. සිය ‘කවි කුසුම’ මෙවන් කවි රචනාවකින් ඇරඹීමට ගෙන ඇති තීරණය ද ඔහු පිළිබඳ බොහෝ දේ අපට හෙළි කරවයි.

කවර හෝ ලේඛකයකු තමන් අතින් ලියවෙන නිර්මාණ සඳහා තම අත්දැකීම් මෙන්ම දුටු දේ, ඇසූ දේ සමග තම හද තුළ රැඳි බොහෝ දේ පාදක කරගනියි. එමගින් රසවත් නිර්මාණ බිහි කරමින් රසික හදවත් තුළ ද ප්‍රකම්පනයක් ඇති කර ලීමට දක්ෂ කවියෙක් සමත් වන්නේය. මිනිස් ජීවිතයෙහි ඇතැම් විට හෝ දක්නට ලැබෙන අල්පේච්ඡතාව, ආගමික නැඹුරුව වැනි ස්වභාවයන් අළලා කවි ලියන්නට සමාධි රාජපක්ෂ යොමු වී ඇති බවට හොඳ නිදසුනකි, මෙම කාව්‍ය කෘතියෙහි ඇතුළත් වන ‘උපාසකම්මා’ නම් කවි පෙළ. මනුෂ්‍යත්වයේ විටෙක දක්නට ලැබෙන අහිංසක ගුණය, සමග කුසල් පිරීමට බොහෝ වියපත් කාන්තාවන් යොමු වන අවස්ථාවන්ට හොඳ උදාහරණයකි, ‘උපාසකම්මා’ නම් කවි පෙළ.

විටෙක දීර්ඝ රචනා ලෙස ද තවත් විටෙක කෙටි විරිත් අනුගමනය කරමින් කෙටි රචනා ලෙස ද තම කාව්‍ය නිර්මාණ හැඩගස්වාගන්නට සමාධි රාජපක්ෂ සමත් වී ඇති බවට ද ‘උපාසකම්මා’ කවි පෙළ සාක්ෂි දරයි.

"සැරසිලා පිරුවටින්
සුදුවන්ව දිදුලමින්
සුරතෙ වූ නවගුණින්
වඩන්නේ බුදු බැතින්

උතුරු සළු පත්කඩේ
හිමි සඳුගෙ බණ හඬේ
සාදු නද මුව තුඬේ
කුසල් සිත් නිති වැඩේ

නසන්නට කෙලෙස් කම්
වඩන්නට ක---සල් දම්
පෝ දිනේ පුර නවම්
තතනමින් වෙර දරම්

අගය දත් තෙරුවනේ
ඇඳී ඇත හද කොනේ
කුසුම් කැන් පුදසුනේ
මෑ අතින් දොහොවුණේ ...."

පෝ දා බෞද්ධ විහාරස්ථානයක බණ මඩුවේ හෝ බෝ සමිඳු අබියස හෝ බවුන් වඩමින් සිටි උවැසියක් පාඨක සිත් තුළ මවා පාන්නට කවියා මෙහිදී සමත් වී ඇත. "උතුරු සළු පත්කඩේ . හිමි සඳුගෙ බණ හඬේ" වැනි යෙදුම් මගින් පෝ දා විහාරස්ථානයක පවත්නා ශාන්ත සුන්දර පරිසරය අළලා පාඨක සිත් බුදු බැතියෙන් නහවමින් මෙවැනි පද වැලක් ගොතන්නට කතුවරයා සමත් වී ඇත.

වෛද්‍ය සමාධි රාජපක්ෂ පිළිබඳ ඇගයීමක යෙදෙන මහාචාර්ය සමන් චන්ද්‍ර රණසිංහ පවසන අන්දමට, "එදා දුටු කුඩා දරුවා, මිනිස් හද ගැස්ම හඳුනන වෛද්‍යවරයකු ලෙස කටයුතු කරන බව සිහි කිරීමත් සතුටකි..... අප විසින් මෙසේ අගය කරනු ලබන්නේ යට කී පරිදි, මනුසත් බවේ හැඩරුව දකිනු රිසි, සාධාරණත්වයේ රැස් දහර විහිදුවනු රිසි, සමාධි රාජපක්ෂය. කෙනෙකුගේ නිලය, බලය හෝ ධනය යෙදවෙන්නේ ආත්මාර්ථය සඳහා පමණක් නම් ඒ චරිතය අපට වැදගත් නොවේ. වෛද්‍ය සමාධි නම් චරිතය අපට දැනෙන්නේ ඔහු සිය නිලය, බලය මෙන්ම ධනය ද ලෝකය සුවපත් කිරීම සඳහාත් යොදවනු කැමති චරිතයක් බැවිනි....."

මෙලෙසින් ඇගයීමට ලක් වන ‘තුවරලා’ කතුවරයා සිය පෞද්ගලික ජීවිතයේදී ප්‍රකට කරන පරාර්ථකාමී බව මෙන්ම අනුන් සුවපත් කිරීමේ සංවේදී හදවතක් ඇත්තකු බව ද යන මේ කරුණු ඔහුගේ කාව්‍ය නිර්මාණවලින් ප්‍රකට කරවයි. ගමේ උපන්, ගමේ සොබා සිරිය විඳි, ගැමියන්ගේ හදවත් හොඳින් හඳුනන කතුවරයා වර්තමාන සමාජය තුළ දරුවන්ට අත් වී ඇති ඛේදනීය ඉරණම පිළිබඳව සිය අදහස් ඇතුළත් කරමින් රසවත් ළමා ගීතයක් ලෙස ද ගැයෙන ‘ගමේ සිරිය’ නම් කවි පන්තිය රචනා කොට ඇත්තේ මෙසේය.

"බඩවැටියේ දුව පනින්න
දං බෝවිටියා කඩන්න
වෙල් එළියේ පැන දුවන්න
අම්මේ තව එක සැරයක්
ගමට යමු අපි

කිරිල්ල බාලොලි කඩන්න
බට තුවක්කු ගෙන විදින්න
පුංචි කුරුලු ගී අහන්න
අම්මේ තව එක සැරයක්
ගමට යමු අපි

සුදු වැල්ලේ පිය මනින්න
ළා බෝ පත් ඇහිඳගන්න
පොඩි සාදුගෙ බණ අහන්න
අම්මේ තව එක සැරයක්
ගමට යමු අපි

ඇළේ දොළේ දුව පනින්න
නෙළුම් මලේ රුව සිඹින්න
සිහිල් සුළං සළු අඳින්න
අම්මේ තව එක සැරයක්
ගමට යමු අපි"

වර්තමාන තරඟකාරී සමාජය තුළ කෘත්‍රිම ජීවිත ගෙවන අපේ දරුවන්ට අත් වී ඇති ඉරණම පිළිබඳ ශෝචනීය තත්වය මැනවින් අවබෝධ කරගත් කවියකුගේ සුන්දර කාව්‍ය නිර්මාණයක් ලෙස උක්ත කවි පෙළ හඳුනාගත හැකිය. එදා ගැමි දරු දැරියෝ තම රසවත් ළමා කාලය ගෙවුවේ දං බෝවිටියා සොයමින්, බඩවැටිවල දුව පනිමින්, කිරිල්ල බාලොලි කඩමින්, බට තුවක්කු ගෙන විදිමින්, ඉතා සැහැල්ලුවෙනි. එම ජීවිතය රට පුරා සිටින හැම දරුවකුටම විඳගන්නට අවකාශ නැති බව ප්‍රකට සත්‍යයකි. ලෝකය මෙන්ම සමාජය ද වෙනස් විය යුතුය. එය ලෝක ස්වභාවයයි. එම විපර්යාසයේදී අතීතයේ පැවති තත්වය හැම අතින්ම වෙනස් වීම නොවැළැක්විය හැකිය. වෛද්‍ය සමාධි රාජපක්ෂ රචනා කර ඇති මෙම කෙටි කාව්‍ය නිර්මාණය මගින්